රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි : 06/2017

මගේ අංකය : EST-2/05/POL/0059
රාජ්‍ය පරිපාලන හා
කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

2017.10.17

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2014.12.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි 07/2014හි 02 ඡේදය කෙරෙහි අවධානය යොමු කරවමි.

02. එකී ඡේදය පහත සඳහන් පරිදි සංශෝධනය කරමි.

> "රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම" යන මැයෙන් 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා එයට ආනුෂංගික චක්‍රලේඛ විධිවිධාන අනුව අදාළ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සපුරා ගනු ලබන නිලධරයන් ද, එම භාෂා අවශ්‍යතාව විකල්ප සුදුසුකම් සපුරා ගැනීමෙන් නිදහස් වන නිලධරයන් ද සම්බන්ධයෙන්, දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ඒ බැව් සනාථ කර ගැනීමෙන් පසුව එකී නිලධරයන්ට ඒ බැව් දැන්වීමත් එහි පිටපතක් පත් කිරීම් බලධරයාට අමතරව පරිපාලන බලධරයා වෙත දැන ගැනීම සඳහා යොමු කිරීමත් ප්‍රමාණවත් බව මෙයින් දන්වා සිටිමි.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය